# දැන්ම ගොඩවෙන්න



සාකච්ඡා කලේ : නලිද සම්පත්

## ජීවිතය වෙනස් කරන නාට්‍යයක්

ප්‍ර "අතුරුපසට වැටි එකක්", "මිනිමරුවා තිරුවතින්" දිගු නාට්‍යය දෙකට පසුව කණිෂ්ක මේ "දැන්ම ගොඩවෙන්න" නාට්‍යය සමඟ කොහෙටද ගොඩවෙන්න හදන්නේ?

පි ඒක දැන ගන්න නම් ඉතින් නාට්‍යය බලන්නම වෙනවා

ප්‍ර හරි එහෙනම් මම මෙහෙම අහන්නම් කො....... මොකක්ද මේ ඔබගේ නවතම නාට්‍යයේ තේමාව

පි පීවිතයේ යථාර්ථය....,

: පීවිතයේ යථාර්ථය...., අපිට ඕනෑම සංකල්පයක් දිහා සාපේක්ෂව බලන්න පුලුවන් උදාහරණයක් විදියට අපි ගමු ප්‍රේමය.... අපිට ප්‍රේමයේ යථාර්ථය මෙය යැයි කියලා නිශ්චිතව රාමුගත කරන්න පුලුවන් එකක් නෙවෙයිනේ ඒක සාපේක්ෂයි.. ඒත් මට, ඔබට ජේන මේ පීවිතයේ යථාර්තය මොකක් හරි එකක් විය යුතුයි. මනුෂ්‍ය සංහතිය ආරම්භයේ ඉඳලා මේතාක් කල් පීවිතය ගැන, එහි යථාර්ථය ගැන විවිධ වු කියවීම්... විවිධ වු අය කරලා තියනවා ඒත් පීවිතයේ යථාර්ථයන් දෙකක් තියෙන්න බැහැ....

ප්‍ර : ඔබ ඉතාමත්ම ආකර්ෂණීය සංවාදයකට මාව පොළඹවනවා කිව්වොත් නිවරදියි ඉතින් ඔබ ඔය කියන අසම සම වු පීවිතයේ යථාර්තය ඔබේ නාට්‍යයේ තේමාව කර ගන්නේ නැතිව ඔබට පුලුවන්නේ ඒ දැනුම වෙන විදියකට සමාජගත කරලා වීරයෙක් වෙන්න.

පි : ඔබේ ඔය ප්‍රශ්නයත් එක්ක ඔබ මාව වේගයෙන් අරගෙන එනවා කාරණාව කෙළින්ම කියන්න. මේ නාට්‍යයේ සන්දර්භය ගොඩනැගී තියෙන්නේ පෙර නොඇසු විරු දහමක් වන බුදු දහමේ නියම හරය වටා බුදු දහම තුළ ඔබ අදහස් කල වීරයෝ බිහි කිරීම අරමුණු කරගන්න දහමක් නොවෙයිනේ. මගේ අවශ්‍යතාව උනේ බුදුදහම තුළින් විවර කරන මනුෂ්‍ය පීවිතයේ යථාර්ථය මා දැඩිව ආශ්‍රය කරනා කලා මාධ්‍ය හරහා සමාජගත කරන්න උත්සහ කරන්නයි.

ප්‍ර : මේක තවත් එක් ජාතක කතාවක්ද?

පි : අනේ නැහැ.... කොහෙත්ම නැහැ...... බුදු දහම කියන්නේ ප්‍රඥා ගෝචර දහමක් ජාතක කතා, ත්‍රිපිටක, අභිධර්ම, පාළි සුත්‍ර...... එවා මේ නාට්‍යයේ නැහැ..... මම ඉතා වගකිමෙන් කියන්නේ බුදු දහමේ නියම හරය අවබෝධ කරන්න ඒවා අත්‍යවශ්‍ය සාධක නෙවෙයි. ප්‍රධාන වශයෙන් වැදගත් වන්නේ ගෞතම බුදුන් සහ උන්වහන්සේගේ දහම පිළිබඳව තියෙන විශ්වාසයයි.

ප්‍ර : ඇයි ඔබට මේ නාට්‍යයට බුදු දහම සන්දර්භ කරගන්න හිතුනේ.

පි : වේදිකාව කියන්නේ මම හරිම කැදර කම්න් බදාගෙන ඉන්න කලා මාධ්‍යයක් බොහෝමයක් වේදිකා නාට්‍යකරුවෝ වගේම මාව ලඟින් දන්න අය දන්නවා මම නාට්‍ය කරන්නේ මුදල් උපයන්න නෙවෙයි කියලා. ඒක මට අවංකව කියන්න පුලුවන් දෙයක් හැබැයි මේ කලා මාධ්‍ය ඇතුලේ රිංගගෙන එකේ රසබර තැන් අපුර්ව තැන් හොයගන්න විතරක් නෙවෙයි ප්‍රේක්ෂකියන්ට වෙනත් අත්දැකිමක් දෙන්න මම හැම අවස්ථාවකම උත්සහ කලා..... එහිදි සමහරක් අය මම ඒ ගත්ත උත්සහයන් සමග එකතු උනා සමහරක් අය ප්‍රතික්ෂේප කරා... ඒක සාමාන්‍ය දෙයක්........ හැබැයි මෙතෙක් මම කරපු හැම නාට්‍යයක්ම මම ප්‍රධාන වශයෙන් වෙනසක් කරන්න උත්සහ ගත්තේ නාට්‍ය ආකෘතියෙන් මොකද නිර්මාණකරුවෙක් විදියට මම ඒක පළමුව වින්දා. ඒත් වර්තමාන සමාජ කියවීම තුළ නිර්මාණයන් වල විවිධ අපුර්ව ආකෘතින් හොයමින් නිර්මාණකරණයේ ප්‍රභලත්වය තහවුරු කරගන්නවට වඩා වැදගත් වගකිමක් තියනවා කියන එක මම හිතුවා ඒ මා එතෙක් එල්ලි සිටි විවිධ වු දෘෂ්ටියන්ගෙන් ගැලවුනාට පස්සේ... ඊට පස්සේ තමයි බුදු දහම හැර අන් කිසි දෙයක් වර්තමානය තුළ සමාජගත කරලා වැඩක් නැහැ කියලා මම ප්‍රත්‍යක්ෂ කරගත්තේ.

ප්‍ර : මට මතකයි ඔබගේ මීට පෙර නාට්‍ය දෙකේ රංගන කාර්ය සඳහා සම්භන්ද වෙලා හිටියේ ලංකාවේ ඉන්න අති දක්ෂ සහ සම්මානනීය නලු නිලියන් මගේ මතකේ හැටියට මහෙන්ද්‍ර පෙරේරා, චාන්දනී සෙනෙවිරත්න, දුලිකා මාරපන, ජගත් චමිල, බිමල් ජයකොඩි..... වගේ අය ඉතින් **"දැන්ම ගොඩවෙන්න"** නාට්‍යත් එක්ක මේ පාර එකතු වෙන්න කව්ද?

පි : ඔව් දැන්ම ගොඩවෙන්න නාට්‍යයේ රංගන දායකත්වය ලබාදෙන්නේ ජගත් චමිල, ජගත් මනුවරන, සරත් කරුණාරත්න, තිලංක ගමගේ.....

විශේෂයෙන්ම සරත් කරුණාරත්න කියන්නෙ මෙවර රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නලුවා සම්මානය ලබාගත් දක්ෂ වේදිකාවට ආදරය කරන රංගන ශිල්පියෙක්, ඒ වගේම මෙම නාට්‍යයේ සංගිත අධ්‍යක්ෂක වරයා ලෙසත් රංගන ශිල්පියෙක් ලෙසත් කටයුතු කරන තිලංක ගමගේ තමයි මෙවර රාජ්‍යනාට්‍ය උළෙලේ හොඳම සංගිත අධ්‍යක්ෂණය සම්මානය ලබා ගත්තේ...... දැන්ම ගොඩවෙන්න නාට්‍ය ගීත හතරක් ඇතුලත් නාට්‍යක් ඉතින් තිලංකගේ සංගිත අධ්‍යක්ෂණයේ හැකියාවත් මෙල්බර්න් ප්‍රේක්ෂකයින්ට බලා ගන්න පුලුවන්.

ප්‍ර : මං හිතන්නේ ජගත් චමිල සහ ජගත් මනුවරණ ගැන ඔබ වැඩි යමක් කිව්වේ නැත්තේ ඔවුන් මෙල්බර්න් ප්‍රේක්ෂකයින් අලුත් දෙන්නෙක් නෙවෙයි නිසා වෙන්නැති.

පි : ඇත්තෙන්ම ඔව්... ජගත් චමිල කියන්නේ අත්දැකිම බහුල ඔහුට ලැබෙන ඕනෑම චරිතයකට සාදාරණයක් කළ හැකි රංගන ශිල්පියෙක්.... ජගත් මනුවරණත් ඉතා ඉහළ රංගන හැකියාවක් තියන රංගන ශිල්පියෙක්.... ඒ වගෙම මම විශේෂයෙන් කියන්න ඕනේ ඔවුන් හතර දෙනාම අමතරව මෙල්බර්න් වලිනුත් දක්ෂ රංගන ශිල්පීන් සහ ගායකයින් කිහිප දෙනෙක්ම මේ නාට්‍යත් සමග එකතු වෙනව. ඒක අපිට ලොකු ආඩම්භරයක්....

ප්‍ර : කණිෂ්ක අපේ සමාජයේ මෙන්න මේවාගේ මතයක් තියෙනවානේ. විශේෂයෙන්ම මේ වගේ රටක නාට්‍යක් බලන්න යන්නේ තමන් ගෙවන අතිශය කාර්යබහුල පීවිතයෙන් මොහොතක් අයින් වෙලා ටිකක් හිනා වෙලා එහෙම එන්න කියලා. නාට්‍ය නිර්මාණ කරුවෙක් විදියට කණිෂ්ක මොකක්ද ඒ ගැන කියන්න තියෙන්නේ.

පි : මං වගේ උඩුගම් බලා පිනන නිර්මාණ කරුවෙකුට ඕකට හොඳ උත්තරයක් දෙන්න පුළුවන්. ඒත් මං මෙහෙම කියන්නම්... මමත් දැන් වසර 09 ක් පමණ මෙල්බන් වල අතිශය කාර්යබහුල පීවිතයක් ගෙවන කෙනෙක්. ඇත්තටම පැය දෙකක නාට්‍යක් බලලා හිනා වෙලා අපිට අපි හොයපු දේ ලැබුනද? ඒක මම පෙරලා හැමෝගෙම හෘද සාක්ෂියට එකතු කරන ප්‍රශ්ණයක්. ඒත් නලින්ද ප්‍රහසනය එහෙම නැත්නම් comedy කියන්නේ සංකිර්ණ සහ වැදගත් නිවැරදිව හඳුනාගත යුතු දෙයක්. විශේෂයෙන්ම වේදිකාව කියන කලා මාධ්‍ය තුල.

ප්‍ර : හොඳයි. මෙල්බන් ප්‍රේක්ෂකයින්ට මොකක්ද අවසාන වශයෙන් කියන්න තියෙන්නේ.

පි : අවසාන වශයෙන් කියන්න තියෙන්නේ නාට්‍යය බලන්න එන්න කියල තමයි. අපි 25$ වගේ ඉතා සාධාරණ මිලකට තමයි ටිකට් එකක මිල නියම කරලා තියෙන්නේ. නොවැම්බර් 19 වැනිදා Hampton park, River gum Performing Arts Centre එකේ සවස 3.30 ට සහ 6.30 ට වේදිකාගත කරන මෙම සංගිතමය / පර්යේෂණාත්මක නාට්‍ය Animareal Theater නිෂ්පාදනයක්. මෙම නවතම නාට්‍ය අත්දැකිම් බෙදා හදා ගන්න ඔබත් එදාට නොවරදවාම පැමිනෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.